සැ. යු. - (i) 2015.05.22 වැනි දින පළ වූ අංක 1,916 දරන *ගැසට් පත්‍රයේ* IV (අ) කොටස පළ නොවීය.

(ii) මෙවර පළවන *ගැසට් පත්‍රයේ* V කොටස යටතේ 2012 වර්ෂයේ ජුනි සිට සැප්තැම්බර් දක්වා වූ කාර්තුවට අදාළව මුද්‍රණ ශිල්පීන්ගේ හා ප්‍රකාශකයින්ගේ ආඥාපනත යටතේ ලියාපදිංචි වූ පොත් නාමාවලියක් ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් පළවේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,917 - 2015 මැයි මස 29 වැනි සිකුරාදා - 2015.05.29**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIආ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව |
|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් .... ... ... | 800 |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | — |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... ... | — |
| රජයේ නොවන දැන්වීම් ... ... ... | 802 |
| රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | — |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... ... | 805 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2015 ජුනි මස 19 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2015 ජුනි මස 05 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**ඩබ්ලිව්. ඒ. ඒ. ජී. ෆොන්සේකා,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.).*

2015 ජනවාරි මස 22 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

## ශ්‍රී ලංකා දුම්රිය සේවය

ලංසු ආරාධනය

කටුනායක (4/520) සිට කුරණ කොළඹ අන්තයට අයත් රේල්පීලි සම්බන්ධ වන ස්ථානය (Top Points) (6/860) දක්වා සහ කුරුණ මීගමු අනන්තයට අයත් රේල් පීලි සම්බන්ධ වන ස්ථානයේ (Top Points) (7/280) සිට ගල්කන්ද දුම්රිය හරස්පාර (8/400) දක්වා වූ ද්විත්ව දුම්රිය මාර්ගය (කි. මී. 3.46) ඉදිකිරීම.

ප්‍රසම්පාදන අංකය SRS/F. 7226

01. ශ්‍රී ලංකා දුම්රිය සේවයට අයත් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ (ප්‍රධාන) සභාපති විසින් කටුනායක (4/520) සිට කුරණ, කොළඹ අන්තයට අයත් රේල්පීලි සම්බන්ධ වන ස්ථානය (Top Points) (6/860) දක්වා සහ කුරණ, මීගමු අන්තයට අයත් රේල්පීලි සම්බන්ධ වන ස්ථානයේ (Top Points) සිට ගල්කන්ද දුම්රිය හරස්පාර (8/400) දක්වා වූ කොටසෙහි පස් ඉවත් කිරීම, පස් පිරවීම සහ ඊට අදාළ කාර්ය සම්පාදනය, ABC ස්තරය මතුපිට යෙදීම සහ මූලික තුලබරු ස්තරය (Ballasts layer) යෙදීම සඳහා මුද්‍රා තබන ලද ලංසු කැඳවනු ලබන අතර 2015.06.11 දින ප. ව. 2.00 දක්වා ලංසු භාරගනු ලැබේ.

2015.06.10 වැනි දින ප. ව. 3.00 දක්වා කාලය තුළ කොළඹ 10, ඕල්කට් මාවතේ දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලය වෙත ආපසු නොගෙවනු ලබන ටෙන්ඩර් ලියවිලි ගාස්තුව වන රුපියල් තුන්දහසක (රු. 3,000) මුදලක් ගෙවා ලබාගනු ලබන ලංසු පෝරම මගින් ලංසු ඉදිරිපත් කළ යුතු ය.

02. ශ්‍රී ලංකා ජාතික ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන්ගේ සංගමයේ (NCCASL) සාමාජිකත්වය දරන හා මහා මාර්ග ඉදිකිරීම් හා වාරිමාර්ග සහ ගොඩබිම් ජලපවහන ක්ෂෙත්‍රයේ, ඉදිකිරීම් අභ්‍යාස හා සංවර්ධන ආයතනයේ (ICTAD) C4 ශ්‍රේණිය හෝ ඉහළ ශ්‍රේණියක ලියාපදිංචි අයවලුන් හට පමණක් ලංසු ලිපිලේඛන නිකුත් කරනු ලැබේ.

03. කොළඹ 10, ඕල්කට් මාවතේ දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලයේ දී ලංසු ලිපි ලේඛන නොමිලේ පරීක්ෂා කො බැලිය හැකි ය.

04. ලංසු අවසන් කරන දින සිට අවම වශයෙන් දින 120 ක කාලයක් සඳහා ලංසු වලංගු විය යුතු ය.

05. ලංසු සමග රු. 850,000 (රුපියල් අට ලක්ෂ පනස් දහසක් පමණි.) ක් වටිනා ලංසු ඇපකරය බැගින් තැබිය යුතු ය.

06. මුද්‍රා තැබූ ලංසු, ලංසු භාරගන්නා අවසාන දිනය හා වේලාවට පෙර සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන( ශ්‍රී ලංකා දුම්රිය සේවය, ප්‍රධාන කාර්යාලය, ඕල්කට් මාවත, කොළඹ 10 යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනවිත් භාරදිය යුතු ය.

07. කොළඹ 10, ඕල්කට් මාවතේ පිහිටි ශ්‍රී ලංකා දුම්රිය සේවාවේ ප්‍රධාන කාර්යාලය තුළ දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු (ප්‍රධාන) සභාපති කාර්යාලයේ දී ලංසු භාරගැනීම අවසන් වූ වහාම එකී ලංසු විවෘත කරනු ලැබේ. ලංසුකරුවන්ට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින්හට ලංසු විවෘත කරන අවස්ථාවට සහභාගි විය හැක.

08. වැඩිදුර තොරතුරු ලබාගැනීම සඳහා දුරකථන අංක 2438078 හෝ 2436818, ෆැක්ස් අංකය 2432044, විද්‍යුත් තැපෑල srs. slr@gmail.com හෝ www.slrail.info වෙබ් අඩවිය මගින් දුම්රිය ගබඩා අධිකාරිවරයා අමතන්න.

යොමු අංකය : SRS/F. 7226

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන)
ශ්‍රී ලංකා දුම්රිය සේවය.

05-794

**මහාධිකරණය - ත්‍රිකුණාමලය**

රාජසන්තක කරන ලද සහ හිමිකම් නොපාන ලද මෝටර් වාහන ටෙන්ඩර් මගින් විකිණීම

ත්‍රිකුණාමලය මහාධිකරණ කලාපයට අයත් කන්තලේ දිසා/මහේස්ත්‍රාත් අධිකරණය විසින් රාජසන්තක කරන ලද සහ හිමිකම් නොපාන ලද පහත විස්තර සඳහන් රථවාහන ටෙන්ඩර් කැඳවා විකිණීමට ත්‍රිකුණාමලය මහාධිකරණ ප්‍රසම්පාදන කමිටුව තීරණය කර ඇත.

විකිණීමට අදාළ රථවාහන 2015.06.01 වැනි දින සිට කන්තලේ දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා මගින් කාර්යාල වේලාවන් තුළ දී එම අධිකරණයේ දී පරීක්ෂා කිරීමට හැකි ය. මීට අදාළ ටෙන්ඩර් අයදුම්පත් හා ලියකියවිලි ත්‍රිකුණාමලය මහාධිකරණ රෙජිස්ට්‍රාර්වරයාගෙන් 2015.06.01 වැනි දින සිට ලබා ගත හැකි ය.

2015.06.26 වැනි දිනෙන් ටෙන්ඩර් කැඳවීම අවසන් කරනු ලබන අතර 2015.06.30 වැනි දින ප. ව. 2.00 ට ටෙන්ඩර් විවෘත කරනු ලැබේ. මේ සඳහා ආපසු නොගෙවන රු. 100 ගාස්තුවක් ගෙවිය යුතු අතර අදාළ පරිදි ආපසු ගෙවනු ලබන ඇප තැන්පත් මුදලක් ද ගෙවිය යුතු ය.

ත්‍රිකුණාමලය මහාධිකරණ කාර්යාලයෙන් ලබා ගන්නා ලද අයදුම්පත් හැර අනෙකුත් අයදුම්පත් හා ඡායාපිටපත් පිළිනොගෙන ප්‍රතික්ෂේප කරනු ලැබේ. එක් ටෙන්ඩර් ඉල්ලුම්කරුවෙකුට එක් රථ වාහනයකට වඩා වැඩි රථ වාහන සංඛ්‍යාවක් සඳහා ඉල්ලුම් කර හැකි අතර, එසේ වුව ද සියලුම රථ වාහන සඳහා වෙන් වෙන් වශයෙන් අයදුම්පත් ඉදිරිපත් කළයුතු ය. අනෙකුත් විස්තර හා කොන්දේසි ටෙන්ඩර් අයදුම්පත සමග සපයනු ලැබේ.

**රථ වාහන පිළිබඳ විස්තරය**

| *අනු. අංකය* | *නඩු අංකය* | *වාහන ලියාපදිංචි අංකය* | *විස්තරය* | *ආපසු ගෙවනු ලබන ඇප තැන්පපත් මුදල රු.* |
|---|---|---|---|---|
| 01. | 46319 | BAV - 9248 | එන්ජින් අංක OE6AE2256964 චැසි අංකය MD634KE60E2A16460 දරන ෆල්සර් වර්ගයේ යතුරු පැදිය | 2,000 |
| 02. | AR485/13 | EPXE - 4819 | එන්ජින් අංකය J 424 - 107232 චැසි අංකය NJ47A - 107242 දරන සුසුකි වර්ගයේ යතුරු පැදිය | 1,000 |
| 03. | 41072 | 226-6245 | එන්ජින් අංකය 4HFI- 140715 චැසි අංකය NPR66L - 7112285 දරන ලොරි රථය | 7,500 |
| 04. | 42117 | EPPQ- 4772 | එන්ජින් අංකය 275IDIDI0BYYS39462 චැසි අංකය MAT445051BVR8923 දරන ඩිමෝ බට්ටා රථය | 5,000 |
| 05 | 34898 | EPJS 8543 | එන්ජින් අංකය R 2- 804288 චැසි අංකය SK22T- 103198 දරන ලොරි රථය | 5,000 |
| 06. | 31833 | EPLD- 9376 | එන්ජින් අංකය SLCFU96129 චැසි අංකය UFZGL49M01013324 දරන ලොරි රථය | 5,000 |
| 07. | 35351 | EPLH-9495 | එන්ජින් අංකය 4 TG 2 - 142431 චැසි අංකය NHS69E - 7415067 දරන ලොරි රථය | 7,500 |

ප්‍රදීප් හෙට්ටිආරච්චි,
මහාධිකරණ විනිසුරු,
සභාපති,
මහාධිකරණ ප්‍රසම්පාදන කමිටුව.

2015 ක් වූ මැයි මස 11 වැනි දින,
ත්‍රිකුණාමලය මහාධිකරණයේ දී ය.

05-718

# රජයේ නොවන දැන්වීම්

## 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම

සමාගමේ නම : බී පී පී එල් එන්ටර්ප්‍රයිසස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 105286
ලියාපදිංචි ලිපිනය : ලෙවල් 03, පාර්ක්වේ ගොඩනැගිල්ල, අංක 48, පාර්ක් වීදිය, කොළඹ 02.

සෙක්‍රටේරියස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
පී වී 5958.

05-648

---

## ඇටෝර්නි බලපත්‍රයක් අවලංගු කිරීම

මහනුවර දිස්ත්‍රික්කයේ, අකුරණ, නීරුල්ල මේල්වේන, අංක 861, දරන ස්ථානයේ පදිංචි මොහොමඩ් උවයිස් පාතිමා පස්මිලා (ජා. හැ. අංකය 857261763 වී) වන මා අකුරණ, නීරුල්ල, මේල්වේන, අංක 861, දරන ස්ථානයේ පදිංචි නුහු සුලයිමාන් මොහොමඩ් උවයිස් (ජා. හැ. අංකය 520232982 වී) යන අයට මහනුවර නීතිඥ හා ප්‍රසිද්ධ නොතාරිස් එම්. එෆ්. එම්. අස්මි මහතා විසින් 2007.08.23 වැනි දින සහතික කරන ලද අංක 2895 දරන ඇටෝර්නි බලපත්‍රය 2015.04.11 වැනි දින සිට අවලංගු කර බලරහිත කර ඇති බව ශ්‍රී ලංකා ජනරජයටත්, මහජනතාවටත් මින් දන්වා සිටිමි. මින් ඉදිරියට ඉහත කී ඇටෝර්නි බලපත්‍රය මගින් කරනු ලබන්නා වූ කිසිදු ක්‍රියාවකට හෝ ගණුදෙනුවකට මා වගනොකියන බව ප්‍රකාශ කර සිටිමි.

05-660

---

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම/ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ කටුනායක වී මෝල පාරේ අංක 687/සී දරන ස්ථානයේ පදිංචි තෙන්නකෝන් මුදියන්සේලාගේ ලලිතා ප්‍රියදර්ශනී වන මම මීගමුව නීතිඥ සහ ප්‍රසිද්ධ නොතාරිස් ෆිලීෂියන් ප්‍රනාන්දු පුල්ලේ මහතා විසින් 2008.05.16 වැනි දින සහතික කළ අංක 11322 දරන විශේෂ ඇටර්නි බලපත්‍රය මගින් එකී ශ්‍රී ලංකා ජනරජයේ කටුනායක වී මෝල පාරේ අංක 687/සී දරන ස්ථානයේ පදිංචි හේරත් මුදියන්සේලාගේ නීලම්මා නමැති අයට ලබාදුන් ඇටර්නි බලය මෙයින් ප්‍රත්‍යාදිෂ්ඨ කොට අවලංගු කරනු ලැබූ බව ශ්‍රී ලංකා ජනරජයේ මහජනතාවත්, අන් සියලු දෙනාත් මෙයින් දැන ගනිත්වා. එකී ඇටර්නි බලපත්‍රය් නම සඳහන් ඇටර්නි බලකාරිය විසින් මෙම දිනයෙන් පසුව මා වෙනුවෙන් කරනු ලබන ක්‍රියාවන් හෝ ගනුදෙනු සම්බන්ධයෙන් මා විසින් කිසිදු වගකීමකට නොබැඳෙන බව ද සියලු දෙනා ම මෙයින් දැනගනිත්වා.

තෙන්නකෝන් මුදියන්සේලාගේ ලලිතා ප්‍රියදර්ශනී.

2015 මැයි මස 07 වැනි දින

05-685

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (01) වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බවට මෙයින් දන්වමු.

සමාගමේ නම : ටැපීබා (පුද්.) සමාගම
ලියාපදිංචි අංකය : පී වී 100116
ලියාපදිංචි කාර්යාලය : අංක 596, නාදෙණිය, මාවනැල්ල
සංස්ථාපිත කළ දිනය : 2014.08.06

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි.

05-701

---

## 2007 අංක 7 දරන සමාගම් පනෙත් 9 වැනි වගන්තිය ප්‍රකාරව මෙයින් නිවේදනය කරනු ලැබේ

සමාගමේ නම : උත්තරාංගි ඇකඩමි ඔෆ් ඩාන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 103773
ලියාපදිංචි කාර්යාලය : අංක 114/7, නව නුවර පාර, කොතලාවල, කඩුවෙල
සංස්ථාපනය කළ දිනය : 2015.02.10

ලේකම්.

05-702

---

## සමාගමක් ලියාපදිංචි කිරීම පිළිබඳ දැන්වීම

2007 අංක 7 දරන සමාගම් පනතේ අංක 9 (1) වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම සංස්ථාපනය කර ඇති බැවින් මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නම : සෙඩාර් රැපිඩ්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි කළ දිනය : 2015.04.23
සමාගමේ අංකය : පී වී 105204
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 32/4, සංඝරාජ මාවත, මහනුවර.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියෝගය පරිදි,

සමාගමේ ලේකම්.

05-703

---

## නිවේදනය

ඔර්ගන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්

2015 අප්‍රේල් මස 16 වැනි දින සංස්ථාපනය කරන ලද බව 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාර මෙයින් නිවේදනය කරනු ලැබේ.

සමාගමේ නම : ඕර්ගන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 105123
ලියාපදිංචි කාර්යාලය : අංක 216, සේරම් පෙදෙස, කොළඹ 10.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

කෝපරේට් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු.

05-704

## ඇටර්නි බලය අහෝසි කිරීම

ඇල්පිටිය, කුරුඳුගහහැතැප්ම, තානායම් කන්ද පාරේ පදිංචි වීරසිරි නාරායන ක්‍රිෂාන්ත ප්‍රදීප් කුමාර වන මම, මා විසින් වර්ෂ 2012.08.26 වැනි දින ගාල්ල අධිකරණ කලාපයේ ප්‍රසිද්ධ නොතාරිස් එස්. පතිරණ මහතා සහතික කළ අංක 1459 දරන ඇටර්නි බලපත්‍රය මගින් ඇල්පිටිය කුරුඳුගහහැතැප්ම, තලාව පාරේ අංක 485 හි පදිංචි පැටි අරඹගේ සමරපාල හෙවත් පැටි අරඹගේ මහින්ද යන අයට දෙන ලද ඇටර්නි බලපත්‍රය මෙයින් අවලංගු කරන බව ශ්‍රී ලංකා ජනරජයටත් පොදු ජනතාවට සහ අනෙකුත් සියලුම දෙනාටත් මෙයින් දන්වා සිටිමි. මින් පසු පෙරකී ඇටර්නි බලපත්‍රය මගින් කරන කිසිදු ගනුදෙනුවක් සම්බන්ධව මම වගකීම භාර නොගන්නා බව මෙයින් තව දුරටත් දන්වා සිටිමි.

වීරසිරි නාරායන ක්‍රිෂාන්ත ප්‍රදීප් කුමාර.

05-708

---

## සාටෝ වෙම්ෆා ලංකා (ප්‍රයිවෙට්) ලිමිටඩ්

### පී වී 18035

ණයහිමියන් විසින් ස්වේච්ඡාවෙන් ගණුදෙනු බේරා වසා දැමීම පිළිබඳ රැස්වීමේ නිවේදනයයි.

2007 අංක 07 දරන සමාගම් පනතේ 334 (1) වගන්තිය යටතේ, සමාගමේ ණයහිමියන්ගේ රැස්වීමක් පහත සඳහන් අරමුණු සඳහා 2015 ජූනි මස 03 වැනි දින පෙ. ව. 10.00 ට අංක 22/2, පැපිලියාන පාර, ගංගොඩවිල, නුගේගොඩ හි දී පැවැත්වෙන බව මෙයින් නිවේදනය කරනු ලැබේ. (තවද, එදින රැස්වීමට සහභාගි නොවන ණයහිමියන් වෙතොත් ණයහිමියන්ගේ රැස්වීමට පෙර දින පෙ. ව. 10.00 ට පෙර අංක 22/2, පැපිලියාන පාර, ගංගොඩවිල, නුගේගොඩ ස්ථානයට පැමිණ අදාළ පෙරකලාසි ගොනු කරන ලෙස ද දැනුම දෙනු ලැබේ.)

* සමාගමේ කටයුතු පිළිබඳ තත්ත්ව ප්‍රකාශය සමාලෝචනය කිරීම
* සමාගමේ ණයහිමියන් විසින් ස්වේච්ඡාවෙන් ගණුදෙනු බේරා වසා දැමීම අනුමත කිරීම/සලකා බැලීම
* 2007 අංක 07 දරන සමාගම් පනතේ, 335 වන වගන්තිය ප්‍රකාර ඈවරකරුවෙකු පත් කිරීම.

අධ්‍යක්ෂක මණ්ඩලයේ අණ පරිදි.

ඩී. ඩී. ධර්මසිරි,
අධ්‍යක්ෂ.

05-709

---

## 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ සමාගමක් ලියාපදිංචි කිරීම පිළිබඳ දැන්වීම

සමාගමේ නම : සයිනේජ් වර්ල්ඩ් ටීස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 105310
ලියාපදිංචි කළ දිනය : 2015 අප්‍රේල් මස 28 වැනි දින,
ලියාපදිංචි ලිපිනය : අංක 133/1, පාගොඩ පාර, පිටකෝට්ටේ.

සමාගම් ලේකම්.

05-715

---

## ටිනූ (ප්‍රයිවට්) ලිමිටඩ්

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ සංස්ථාගත කිරීම පිළිබඳව මහජනතාවට කෙරෙන දැනුම් දීමයි

2015 මාර්තු මස 31 වැනි දින සමාගම් ලියාපදිංචි අංක පී වී 104867 යටතේ ටිනූ (ප්‍රයිවට්) ලිමිටඩ් යන නාමය යටතේ නව සමාගමක් සංස්ථාගත කරනු ලැබ ඇති බව සහ නව සමාගමේ ලියාපදිංචි කාර්යාලීය ලිපිනය කොළඹ 03, ඩීල්පෙදෙස, අංක 2, එම් ඇන්ඩ් එන් ගොඩනැගිල්ල (5 වන තලය), හි බව අපි මෙයින් මහජනතාවට දැනුම් දෙමු.

කන්දයියා නීලකන්ඩන්,
සභාපති.

එන් ඇන්ඩ් එන් ඒජන්ට්ස් ඇන්ඩ් සෙක්‍රටරීස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
(සමාගමේ සමාගම් ලේකම්වරු),
එම් ඇන්ඩ් එන් ගොඩනැගිල්ල,
(5 වන තලය),
අංක 2, ඩීල් පෙදෙස,
කොළඹ 03.

05- 711

---

## ඔප්පො ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ සංස්ථාගත කිරීම පිළිබඳව මහජනතාවට කෙරෙන දැනුම් දීමයි

2015 අප්‍රේල් මස 10 වැනි දින සමාගම් ලියාපදිංචි අංක පී වී 105048 යටතේ ඔප්පො ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් යන නාමය යටතේ නව සමාගමක් සංස්ථාගත කරනු ලැබ ඇති බව සහ නව සමාගමේ ලියාපදිංචි කාර්යාලීය ලිපිනය කොළඹ 03, අබ්දුල් කෆූර් මාවත, අංක 20/1 හි, බව අපි මෙයින් මහජනතාවට දැනුම් දෙමු.

කන්දයියා නීලකන්ඩන්,
සභාපති.

එන් ඇන්ඩ් එන් ඒජන්ට්ස් ඇන්ඩ් සෙක්‍රටරීස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
(සමාගමේ සමාගම් ලේකම්වරු),
එම් ඇන්ඩ් එන් ගොඩනැගිල්ල,
(5 වන තලය),
අංක 2, ඩීල් පෙදෙස,
කොළඹ 03.

05- 712

---

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනත යටතේ පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බවට පනතේ 9 (1) වගන්තිය යටතේ මෙයින් දන්වා සිටිනු ලැබේ.

ලියාපදිංචි සමාගමේ නම : රීජන් මෙඩ් (පුද්ගලික) සමාගම
ලියාපදිංචි අංකය : පී වී 104619
ලියාපදිංචි කළ දිනය : 2015 මාර්තු මස 20
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : අංක 48, 27 වැනි පටුමග, කොළඹ 03.

සී. වී. කේ. පෙරියප්පෙරුම,
සමාගම් ලේකම්.

05-713

**සමාගම් සංස්ථාගත කිරීම පිළිබඳ දැන්වීම**

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ දක්වනු ලබන්නේ,

2011 ඔක්තෝබර් මස 04 වැනි දින පහත නම සඳහන් පුද්ගලික සමාගම, සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව යටතේ පිහිටවනු ලැබූ බවයි.

සමාගමේ නම : නෙට්පර්ල් ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී. වී. 81649
සමාගමේ ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : අංක 63 2/3, නුවර පාර, කිරිබත්ගොඩ.

අධ්‍යක්ෂක මණ්ඩලයේ උපදෙස් මත,

2015 මැයි මස 07 වැනි දින.

05-723

---

**ඇටෝර්නි බලපත්‍ර අවලංගු කිරීම**

මෙයින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත් මහජනතාවටත් දැනුම් දෙන ලද්දේ අංක 729 දරන 1971.02.19 දිනැති කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඒ. එම්. එම්. තාසිම් විසින් සහතික කරන ලද බස්නාහිර පළාත, කොළඹ දිස්ත්‍රික්කය, කොළඹ 06, 36 වන පටුමග, අංක 12 හි පදිංචි අබ්දුල් සමීම් මොහොමඩ් ස්ෆහානි යන අයට කොළඹ 06, 36 වන පටමුග, අංක 12 හි පදිංචි අබ්දුල් රෂීඩ් අබ්දුල් සමීම් වන මා විසින් ලබාදුන් ඇටෝර්නි බලපත්‍රය 2015.05.13 වැනි දින සිට අවලංගු කර අහෝසි කරන ලදී. මේ දින සිට ඇටෝර්නි බලකරු විසින් ඉහත සඳහන් ඇටෝර්නි බලපත්‍රය යටතේ කරන ලද කිසියම් ක්‍රියාවලට සහ පියවර වලට මා වගකියනු නොලැබේ.

අබ්දුල් රෂීඩ් අබ්දුල් සමීම්.

2015 මැයි මස 13 වැනි දින.

05-745

---

**2007 අංක 07 දරන සමාගම් පනතෙහි 9 (2) වගන්තිය යටතේ සමාගම සංස්ථාපනය කිරීම**

**නම් වෙනස් කිරීම**

ද බුක්සෙලර්ස් ඇන්ඩ් ඉම්පෝටර්ස් ඇසෝසියේෂන් ඔෆ්, සිලෝන් යන සමාගමෙහි නම සිලෝන් බුක්සෙලර්ස් ඉම්පෝටර්ස් ඇන්ඩ් එක්ස්පෝටර්ස් ඇසෝසියේෂන් වශයෙන් 2015 අප්‍රේල් මස 30 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි වෙනස් කර ඇති බැව් මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමෙහි විස්තර පහත දැක්වේ. -

සමාගමෙහි පෙර නම : ද බුක්සෙලර් ඇන්ඩ් ඉම්පෝටර්ස් ඇසෝසියේෂන් ඔෆ්, සිලෝන්
ලියාපදිංචි අංකය : ජී ඒ 2251
ලියාපදිංචි කාර්යාලයීය ලිපිනය : අංක 23, ඒකනායක පාර, නුගේගොඩ
සමාගමෙහි අලුත් නම : සිලෝන් බුක්සෙලර්ස් ඉම්පෝටර්ස් ඇන්ඩ් එක්ස්පෝටර්ස් ඇසෝසියේෂන්

කෝපරේට් මැනේජ්මන්ට් කන්සල්ටන්ට්ස් ඇන්ඩ් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්.

05-766

---

**දැන්වීමයි**

වර්ෂ 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වැනි වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බවට මෙයින් දැන්වමු.

සමාගමේ නම : සිනර්ජි අයි ටී (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 105090
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : අංක 100/ඒ, පේරලන්ද පාර, රාගම.
ලියාපදිංචි දිනය : 2015.04.10

(ඉහත සඳහන් සමාගමේ ලේකම්වරු)

05-768

---

**දැන්වීමයි**

වර්ෂ 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වැනි වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම් සංස්ථාපිත කළ බවට මෙයින් දැන්වමු.

සමාගමේ නම : රූ සලු ක්ලෝතිංග් (පීවීටී) එල්ටීඩී
ලියාපදිංචි අංකය : පී වී 94042
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : අංක 640, ගිරිඋල්ල පාර, කඳවල, කටාන
ලියාපදිංචි දිනය : 2013.08.13

සමාගමේ නම : ඩුන්වේල් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 104935
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : අංක 16/18, මාලිගාව පාර, ඇතුල්කෝට්ටේ
ලියාපදිංචි දිනය : 2015.04.02

සමාගමේ නම : ඇවෝරා ඩිජිටල් ඉමේජින් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 104741
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : අංක 20, චිත්තම්පලම් ඒ ගාර්ඩන් මාවත, කොළඹ 02.
ලියාපදිංචි දිනය : 2015.03.25

සමාගමේ නම : ස්ට්‍රැටර්ජික් වෙන්චර්ස් (පීවීටී) එල්ටීඩී
ලියාපදිංචි අංකය : පී වී 104290
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : අංක 77 ඒ/1, මවුන්ට් කැල්වරි පාර, ජාඇල
ලියාපදිංචි දිනය : 2015.03.06

සමාගමේ නම : ගුරුබෙඋල ෆාම්ස් ඇන්ඩ් රෙස්ටොරන්ට්ස් (පීවීටී) එල්ටීඩී
ලියාපදිංචි අංකය : පී වී 104118
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : අංක 272/26, සුදර්ශන මාවත, මාළඹේ
ලියාපදිංචි දිනය : 2015.02.26

(ඉහත සඳහන් සමාගම් හි ලේකම්වරු)

05-769

### ප්‍රසිද්ධ නිවේදනය

වර්ල්ඩ් ට්‍රැවල් ලින්ක් ෆ්ලයිට් ක්රූ (ප්‍රයිවට්) ලිමිටඩ් 2007 අංක 07 දරන සමාගම් පනතේ 07 වැනි වගන්තිය ප්‍රකාරව 2015 අප්‍රේල් මස 24 වැනි දින සංස්ථාපනය කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සමාගමේ නම : වර්ල්ඩ් ට්‍රැවල් ලින්ක් ෆ්ලයිට් ක්රූ (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 105251
ලියාපදිංචි කාර්යාලය : 195, අම්පාර පාර, අක්කරපත්තු 21

අධ්‍යක්ෂවරුන්ගේ අණ පරිදි,

සමාගම් ලේකම්.

05-777

### ඇටෝර්නි බලය අවලංගු කිරීම

ගාල්ල, මීනුවන්ගොඩ, ශ්‍රී ගුණරත්න මාවත (පරණ ක්‍රිප්ස් පාර), අංක 10, "කේතුමතී" හි පදිංචි ලංකේශ්වර අනුරුද්ධ අතපත්තු පුස්සේවල යන අය විසින්, ගාල්ල හික්කඩුව, නලාගස්දෙණිය, ශ්‍රී සෝරත මාවත හි පදිංචි විජේතුංග බටබැදිගේ සමන් (ජා. හැ. අංක 440692265 V) යන අයට දෙන ලද, වර්ෂ 2009.08.03 වැනි දින ප්‍රසිද්ධ නොතාරිස් ගෝපිකා ප්‍රියරංජිකා මිරිස්ස ලොකුගේ මහත්මියගේ අංක 1581 දරන විශේෂ ඇටෝර්නි බලපත්‍රය වර්ෂ 2015 මැයි මස 14 වැනි දින සිට අහෝසි කර අවලංගු කරන බවත්, එකී විජේතුංග පටබැදිගේ සමන් යන අය, ලංකේශ්වර අනුරුද්ධ අතපත්තු පුස්සේවල යන අයගේ ඇටෝර්නි බලකරු නොවන බවත්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ලක්වැසියන්ට මෙයින් දැනුම් දෙන අතර, එකී ඇටෝර්නි බලකරු විසින් කරනු ලබන කිසිදු ක්‍රියාවක් ලංකේශ්වර අනුරුද්ධ අතපත්තු පුස්සේවල යන අය වෙනුවෙන් කරනු ලබන ක්‍රියාවක් නොවන බව වැඩිදුරටත් දැනුම් දෙමි.

ලංකේශ්වර අනුරුද්ධ අතපත්තු පුස්සේවල.

05-782

### දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වගන්තිය ප්‍රකාරව පහත නම් සඳහන් සමාගම සංස්ථාගත කළ බව මෙයින් දැනුම් දෙමු.

සමාගමේ නාමය : නිව් සිල්ක් රෝඩ් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 105119
ලියාපදිංචි ලිපිනය : අංක 102, යුනියන් පෙදෙස, කොළඹ 02
ලියාපදිංචි දිනය : 2015 අප්‍රේල් මස 16 වැනි දින.

කෝපරේට් ඇඩ්වයිසරි සර්විසස් (පීවීටී) එල්ටීඩී,
සමාගම් ලේකම්වරු.

05-780

### ප්‍රසිද්ධ නිවේදනය

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාගත කිරීම නිවේදනය කරනු ලැබේ.

සමාගමේ නම : කෙවෙරන්ට් (ප්‍රයිවෙට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී. වී. 104205
සංස්ථාගත කළ දිනය : 2015 අප්‍රේල් 06
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 47, පීටර් මෙන්ඩිස් පාර, මීගමුව.

ලීසන්ස් රේමන්ඩ්,
අධ්‍යක්ෂ.

05-791

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

### ලංකා බැංකුව

1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 22 වගන්තිය යටතේ විකිණීම පිළිබඳ දැන්වීම

ණය යොමු අංකය : 75221568.
අවිස්සාවේල්ල, රත්නපුර පාර, අංක 133/11 හි පදිංචි හේරත්මුදියන්සේලාගේ චන්දන කීර්ති බණ්ඩාර මහතා සහ කන්හේලගේ යමුනා කුසුම් කුමාරි මහත්මිය යන අයට අයත් උකස් කරන ලද දේපළ විකිණීම.

ලංකා බැංකු ආඥාපනතේ 19 වැනි වගන්තිය යටතේ සම්මත කරනු ලැබ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2015 මාර්තු 13 දිනැති අංක 1906 දරන ගැසට් පත්‍රයේ හා 2015 පෙබරවාරි මස 27 වැනි දින "ඩේලිනිව්ස්", "දිනමිණ" හා "තිනකරන්" යන පුවත්පත් වල පළකරන ලද ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ යෝජනා සම්මුතියකට අනුකූලව මුල් ණය මුදලේ ශේෂයද, විකිණීම කෙරෙන දිනය තෙක් ඒ මත අයවිය යුතු පොලිය ද, ලංකා බැංකු ආඥාපනතේ අංක 26 වන වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස මෙහි පහත උපලේඛනයේ විස්තර කොට ඇති දේපළ සහ පරිශ්‍ර එකී ස්ථානයේ දීම 2015 ජූනි 25 වැනි බ්‍රහස්පතින්දා දින පෙ. ව. 11.00 ට, මහනුවර ටොරින්ටන් පාරේ, අංක 24 හි වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වා සිටිමු.

### පළමු උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලෙ පත්තුවේ, බොරලැස්ගමුව නගර සභා සීමාව තුළ කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, එගොඩවත්ත ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, බොරලැස්ගමුවෙහි පිහිටි දෙවන පටුමගේ එගොඩවත්ත වරිපනම් අංක 22/31 සී දරන හල්ගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු

එම්. එම්. සේනක ප්‍රනාන්දු විසින් සාදන ලද 2011.06.03 දිනැති අංක 2314 දරන පිඹුරෙහි ලොට් 1ඒ2 ලෙස දක්වා සීමා නිර්ණය කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල උතුරට : එකී අංක 2314 දරන පිඹුරෙහි ලොට් 1ඒ 1, නැගෙනහිරට : දැනට පවත්නා පාරද, දකුණට : පාර ද, බස්නාහිරට : සරත් සහ සුනිල් උරුමකම් කියන දේපළ සහ අංක 2314 රදන පිඹුරෙහි ලොට් 1ඒ 1 ද මායිම්ව පර්චස් දහයක (අ. 0 රූ. 0 පර්. 10) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර මෙය දෙල්කඳ නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 57/119 හි ලියාපදිංචි කර ඇත.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලෙ පත්තුවේ, බොරලැස්ගමුව නගර සභා සීමාව තුළ කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, එගොඩවත්ත ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, බොරලැස්ගමුවෙහි පිහිටි එගොඩවත්ත දෙවැනි පටුමගේ වරිපනම් අංක 22/31 සී දරන හල්ගහවත්ත නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු එම්. එම්. සේනක ප්‍රනාන්දු විසින් සාදන ලද 2011.06.03 දිනැති අංක 2314 දරන පිඹුරෙහි ලොට් ඒ 1 ලෙස දක්වා සීමා නිර්ණයකොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල උතුරට : බලයලත් මිනින්දෝරු එන්. ඩී. ද කොස්තා විසින් සාදන ලද 1979.12.25 දිනැති අංක 459 දරන පිඹුරෙහි ලොට් 2 ද, නැගෙනහිරට : දැනට පවත්නා පාර සහ එකී අංක 2314 දරන පිඹුරෙහි ලොට් ඒ 2 ද, දකුණට : අංක 2314 දරන පිඹුරෙහි ලොට් 1 ඒ 2 සහ සරත් හා සුනිල්ට අයිති ඉඩම ද, බස්නාහිරට සරත්, සුනිල් උරුමකම් කියන දේපළ සමග ආනන්ද උරුමකම් කියන එම ඉඩමේ ඉතිරි දේපළ ද, මායිම්ව පර්චස් විසිදෙකයි දශම නවයයි හතරක (අ. 0, රූ. 0, පර්. 22.94) ක බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර එහි ඇති වෙනත් සියලු දේ ද සමග වේ.

ලොට් 1ඒ 1 ලෙස දක්වා ඇති එකී ඉඩම් කැබැල්ල පහත සඳහන් ඉඩමෙන් බෙදා සීමා නිර්ණය කරන ලද කොටසකි :

එකී බොරලැස්ගමුවෙහි පිහිටි හල්ගහවත්ත නමැති ඉඩමෙහි බලයලත් මිනින්දෝරු එන්. ඩී. ද කොස්තා විසින් සාදන ලද 1979.12.25 දිනැති අංක 459 දරන පිඹුරෙහි ලොට් 1 ලෙස දක්වා සීමා නිර්ණය කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල උතුරට : මෙම ඉඩමේ ඉතිරි කොටසද, නැගෙනහිරට : අඩි පාර ද, දකුණට හල්ගහකුඹුර සහ ජී. බර්නෝමිස්ට අයත් මෙම ඉඩමේ ඉතිරි කොටස ද, බස්නාහිරට : අඩි 4 පළල දෙවට පාර ද, මායිම්ව පර්චස් තිස් හයක (අ. 0, රූ. 0, පර්. 36) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර එහි ඇති වෙනත් සියලු දේ ද සමග වේ. මෙය දෙල්කඳ නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර ඇත.

### දෙවන උපලේඛනය

එකී බොරලැස්ගමුවෙහි පිහිටි තල්ගහවත්ත නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු ඒ. හෙට්ටිගේ විසින් සාදන ලද 1985.05.10 දිනැති අංක 1084 දරන පිඹුරෙහි ලොට් 1 (පාරට වෙන් කළ කොටස) ලෙස දක්වා සීමා නිර්ණය කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල උතුරට : බලයලත් මිනින්දෝරු ඩී. ඩී. ඩබ්. සමරකෝන් විසින් සාදන ලද අංක 1273 දරන පිඹුරෙහි අඩි 10 පළල පාරට වෙන් කළ කොටස, නැගෙනහිරට : ලොට 2 ද, දකුණට : බලයත් මිනින්දෝරු එන්. ඩී. ද කොස්තා විසින් සාදන ලද අංක 459 දරන පිඹුරෙහි ලොට් 2 හා 3 ද, මායිම්ව පර්චස් තුනයි දශම හයයි හයක (අ. 0, රූ. 0, පර්. 3.66) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර මෙය දෙල්කඳ නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 66/109 හි ලියාපදිංචි කර ඇත.

එකී බොරලැස්ගමුවෙහි පිහිටි හල්ගහවත්ත නමැති ඉඩමේ අංක 1048 දරන එකී පිඹුරෙහි ලොට් 2 (පාරට වෙන් කළ කොටස) ලෙස දක්වා සීමා නිර්ණය කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල උතුරටඃ අංක 1273 දරන එකී පිඹුරේ අඩි 10 පළල පාර සඳහා වූ පාරට වෙන් කළ කොටස ද, නැගෙනහිරට : හල්ගහවත්ත ද, දකුණට : ලොට් 3 ද, බස්නාහිරට : ලොට් 1 ද මායිම්ව පර්චස් දෙකයි දශම හතරයි හතරක (අ. 0, රූ. 0, පර්. 2.44) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර මෙය දෙල්කඳ නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 66/110 හි ලියාපදිංචි කර ඇත.

එකී බොරලැස්ගමුවෙහි පිහිටි හල්ගහවත්ත නමැති ඉඩමේ අංක 1084 දරන පිඹුරෙහි ලොට් 3 (පාරට වෙන් කළ කොටස) ලෙස දක්වා සීමා නිර්ණය කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල උතුරට : ලොට් 2 ද, නැගෙනහිරට : හල්ගහවත්ත ද, දකුණටඃ හල්ගහවත්ත ද, බස්නාහිරට : එකී අංක 459 දරන පිඹුරෙහි ලොට් 1 ද, මායිම්ව පර්චස් එකයි දශම හයයි පහක (අ. 0, රූ. 0, පර්. 1.65) ක බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර මෙය දෙල්කඳ නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 66/111 හි ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

වී. වික්‍රමසිංහ මයා,
ශාඛා කළමනාකරු.

ලංකා බැංකුව,
අවිස්සාවේල්ල.
2015 අප්‍රේල් මස 08 වැනි දින.

05-787

---

### හැටන් නැෂනල් බැංකුව - නගර කාර්යාලය

(හැටන් නැෂනල් බැංකු සමාගම ලෙස මින් පෙර දැනුවත් වී ඇති පරිදි)

1990 අංක 04 දරන බැංකු (විශේෂ විධිවිධාන) පනතෙහි කාණ්ඩ අංක 4 යටතේ ණය ආපසු ලබාගැනීම වෙනුවෙන් විකිණීම

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ මහ නගර සභා සීමාව තුළ කොල්ලුපිටියේ අර්නස්ට් ද සිල්වා මාවතේ තක්සේරු අංක 11 දරන ස්ථානයේ පිහිටා ඇති එල්. මැක් නමැති අවසරලත් මිනින්දෝරු විසින් කැබලි අංක "ඒ" ලෙස සලකුණු කොට බෙදා වෙන් කරන ලද සහ විස්තර

කර ඇති බිම් කොටස වන එනම් 1950 අගෝස්තු මස 03 දාතමින් යුත් සැලසුම් අංක 131න් දක්වා ඇති අක්කර 0, රූඩ් 0, පර්චස් 36.4 ක ප්‍රමාණයෙන් යුත් ලුලුවර්ත් සහ ඔලිම්පස් යන නම් වලින් හඳුන්වනු ලබන ඉඩම, ගොඩනැගිලි සහ එහි පිහිටි සියලුම දෑ.

මෙය සීමාසහිත හැටන් නැෂනල් බැංකු සමාගමට සුරකුම්ලත් දේපලක් වන අතර ණය ගැත්තා ලෙස මාලබේ පිහිටි ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට් (පුද්ගලික) සමාගමට පහසුකම් ප්‍රදානය කිරීම සඳහා සහ උකස්කරු ලෙස කහන්ද ගමගේ දයා ශාන්ත කහන්දසුමිත්‍රා කරුණාරත්න විසින් උකස් කරන ලද සහ බැංකුව යටතට පත්කොට ඇති එන්. එම්. සී. වෙත්තසිංහ විසින් සහතික කරන ලද 2003 නොවැම්බර් මස 28 දාතමින් යුත් බැඳුම්කර අංක 2108 සහ 2005 දෙසැම්බර් මස 08 දාතමින් යුත් බැඳුම්කර අංක 2593 යන බැඳුම්කර දෙක ද එම්. පී. එම්. මොහොට්ටි විසින් සහතික කරන ලද 2007 ජනවාරි මස 08 දාතමින් යුත් බැඳුම්කර අංක 3284 සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් යූ. එස්. කේ. හේරත් විසින් සහතික කරන ලද 2012 දෙසැම්බර් මස 06 දාතමින් යුත් එකී බැඳුම්කර වලට නියමිත ගෙවීම් ලැබීමට ඇත.

ඉහත සඳහන් දේපළ 2015 ජූනි මස 23 වැනි අඟහරුවාදා පෙ. ව. 11.00 සිට ප්‍රසිද්ධ වෙන්දේසියේ ඉඩමේ දී විකිණේ.

යෝජනා සම්මුතිය කිරීමේ දැන්වීම සඳහා කරුණාකර 2015 අප්‍රේල් මස 30 වැනි දිනැති *රජයේ ගැසට් පත්‍රය* සහ 2015 මැයි මස 06 වැනි දින ඩේලිමිරර් ලක්බිම සහ තිනකුරල් පුවත්පත් බලන්න.

*දේපල වෙත පිවිසීමේ මාර්ගය.* - කොළඹ කොටුව දෙස සිට පැමිණේ නම් ලෝටස් පාර, සර් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත, කුමාරන් රත්නම් පාර, හරහා කොම්පඤ්ඤවීදිය හංදිය පසුකර සර් ජේම්ස් පීරිස් මාවත, ශ්‍රී ජිනරතන මාවත හරහා නොනැවතී සර් අර්නස්ට් ද සිල්වා මාවතෙහි සැතපුම් 1 යි යාර 75 ක දුර ප්‍රමාණයක් ආනන්ද කුමාරස්වාමි මාවතෙහි හරස් මාරුව පසු කරමින් (මින් පෙර ග්‍රීන් පාත් ලෙස දැනුවත් ව ඇති), වමට හැරෙන විට හමුවන මැකඩමයිස්ඩ් පුද්ගලික පාරේ පැත්තකින් පිහිටි බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවට අයත් පරිශ්‍රය පසුකරමින් අවසාන දුර ප්‍රමාණය යාර 40ක් පමණ ඉදිරියට ගමන් කරන විට සර් අර්නස්ට් ද සිල්වා මාවතේ (මින් පෙර මල්පාර ලෙස දැනුවත් වී ඇති) වර්තමාන තක්සේරු අංක 11 හමුවන අතර එය කෙලින් ම කල් ඩී සැක් නමින් හඳුන්වන පුද්ගලික පාරේ කෙළවරට වැටී ඇත.

*ගෙවීම් කළ යුතු ආකාරය .-* සාර්ථක ගැනුම්කරුවෙක් නම් පහත සඳහන් ප්‍රමාණයෙන් මුදලින් ඒ අවස්ථාවේ දී ගෙවිය යුතු ය.

1. මිලදී ගත් වටිනාකමින් 10%,
2. 1%ක් වන දේශීය අධිකාරියට ගෙවිය යුතු දේශීය විකිණීම් බදු,
3. මිලදීගත් වටිනාකමින් 2 1/2% ක් වන වෙන්දේසිකරු වට්ටම්,
4. රු. 500 ක් බැගින් ලිපිකරු සහ ගෝෂක ගාස්තුව,
5. විකිණීම් පිරිවැය සහ අනෙකුත් සියලුම අයකිරීම් වේ නම්,
6. විකිණීම් සහතිකය සඳහා මුද්දර ගාස්තුව.

ශ්‍රී ලංකා රජයෙන් හෝ වෙනත් බලයලත් අධිකාරියකින් පවරා ඇති සහ ඕනෑම විටක යෝග්‍ය වෙනත් ව්‍යවස්ථානුකූල ප්‍රුහු, යුතුකම් බදු හෝ අයකිරීම් සමග මිලදීගත් වටිනාකමෙන් ඉතිරි 90% දේපළ විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත ගෙවා නිමකළ යුතු ය.

හිමිකම් ඔප්පු සහ අනෙකුත් ඒ හා සම්බන්ධ ලේඛණ කොළඹ 10, ටී. බී. ජයා මාවතේ, අංක 479 පිහිටි සීමාසහිත හැටන් නැෂනල් බැංකු සමාගමේ සහකාර සාමාන්‍යාධිකාරී (ප්‍රතිසාධන) වෙතින් පරීක්ෂා කරගත හැක. දුරකථන අංක 011 2661816 ෆැක්ස් අංකය 011 2661835.

ඩැලස් කෙලාට්,
බලයලත් වෙන්දේසිකරු.

අංක 146/3, කල්දේරා ගාඩින්ස්, ඕෆ් දුටුගැමුණු වීදිය,
කොහුවල.

දුරකථන අංක : 011 4302622/ 011- 4302623
ෆැක්ස් අංකය : 011 2856013.

05-798

---

**කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී - කළුතර ශාඛාව**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රධානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී (ලියාපදිංචි අංක පී කිව් 116) මගින් මා වෙත පවරා ඇති බලය ප්‍රකාර ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

**පළමු උපලේඛනය**

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, පානදුර තොටමුණේ පානදුර තල්පිටි දෙබැද්දේ පානදුර ප්‍රාදේශීය සභාවේ කෙසෙල්වත්ත උපකාර්යාල සීමාව තුළ කෙසෙල්වත්තේ පිහිටි ගොඩපරගහලන්ද නොහොත් දෙල්ගහවත්ත සහ දෙල්ගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු සී. පී. කුමාරගේ විසින් 2001 ජනවාරි මස 05 වැනි දින සාදන ලද අංක 1185 දරන පිඹුරේ ලොට් ඒ දරන ප්‍රමාණය : පර්චස් විසිනමයයි දශම අටයි එකක් (අ. 0, රූ. 0, පර්. 29.81) විශාලත්වයෙන් වූ ඉඩම සමඟ ගොඩනැගිලි ගහකොළ සහ එහි පිහිටි සියලු දේ සමග වේ.

**දෙවන උපලේඛනය**

1. බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ පානදුර තොටමුනේ පානදුර තල්පිටි දෙබැද්ද සීමාව තුළ කෙසෙල්වත්තේ පිහිටි පුහුහෙරලියගහවත්ත (බලයලත් මිනින්දෝරු එච්. ඩබ්. ප්‍රනාන්දු විසින් 1979 ඔක්තෝබර් මස 22 වැනි දින මැන බෙදා වෙන් කරන ලද අංක 3726 දරන පිඹුරේ ලොට් 1එච්) නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. ලියනගේ විසින් 1990 දෙසැම්බර් 09 වැනි දින සාදන ලද අංක 1098 දරන පිඹුරේ ලොට් 1Ha දරන ප්‍රමාණය පර්චස් තිහක් (අ. 0 රූ. 0 පර්. 30) විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි ගහකොළ සහ එහි පිහිටි සියලු දේත් සමග වේ.

2. ඉහත සඳහන් කෙසෙල්වත්තේ පිහිටි පුහුහෙරලියගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. ලියනගේ විසින් 1990 දෙසැම්බර් මස 09 වැනි දින සාදන ලද අංක 1098 දරන පිඹුරේ ලොට් 1Hb දරන ප්‍රමාණය පර්චස් දාහතයි දශම නමයයි හතරක් (අ. 0, රූ. 0, පර්. 17.94) විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි ගහකොළ සහ එහි පිහිටි සියලු දේත් සමග වේ.

ඉහත සඳහන් කෙසෙල්වත්තේ පිහිටි පුහුහෙරලියගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. ලියනගේ විසින් 1990 දෙසැම්බර් මස 09 වැනි දින සාදන ලද අංක 1098 දරන පිඹුරේ ලොට් 1HC දරන (අඩි 10ක් පළල පාරක් සඳහා වෙන්කරන ලද) ප්‍රමාණය පර්චස් දෙකයි දශම හතරයි හයක් (අ. 0 රූ. 0 පර්. 2.46) මාර්ග අයිතිය ද සමග වේ.

පානදුර, කෙසෙල්වත්ත, පන්සල පාරේ, අංක 289/112, දරන ස්ථානයේ ලියාපදිංචි කාර්යාලය පිහිටි ශ්‍රී ලංකාව තුල නීත්‍යානුකූල සමාගමක් වශයෙන් ස්ථාපිත එෂියන් ට්‍රේඩින් ඇන්ඩ් මාකටින් කම්පණි (ප්‍රයිවට්) ලිමිටඩ් ණයකරු හැටියට සහ ජයන්ත දැඩිගම උකස්කරු හැටියට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. ට උකස් කරන ලද ඉහත 1 වන සහ 2 වන උපලේඛනවල සඳහන් දේපළ

(1) පළමුවන උපලේඛනයේ සඳහන් දේපළ ලොට් A (අ. 0 රූ. 0 පර්. 29.81) වර්ෂ 2015ක් වූ ජුනි මස 19 වැනි දින පෙ. ව. 10.30 ට (2) දෙවන උපලේඛනයේ සඳහන් දේපළ ලොට් 1Ha (අ. 0 රූ. 0 පර්. 30) ලොට් 1Hb (අ. 0 රූ. 0 පර්. 17.94) වර්ෂ 2015ක් වූ ජුනි මස 19 වැනි දින පෙ. ව. 11.30ට මා විසින් ඉහත ස්ථානවලදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2014.12.05 වැනි දින *රජයේ ගැසට් පත්‍රයද*, 2014.12.09 ලක්බිම, ද අයිලන්ඩ් සහ වීරකේසරී පුවත්පත් ද බලන්න. විකිණීම පිළිබඳ දැන්වීම සඳහා 2015.05.29 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* ද, 2015.06.01 වැනි දින ලක්බිම, ද අයිලන්ඩ් සහ වීරකේසරී පුවත්පත් ද බලන්න.

*ඉඩම්වලට පිවිසීම.* -

### 1 වැනි උපලේඛනය සඳහන් දේපළ

කෙසෙල්වත්ත හංදියේ සිට (මොරටුව නගරයේ සිට ගාලු පාරේ කි. මී. 3.5ක් පානදුර දෙසට ගමන් කළ විට) දිග්ගල තොටුපල පාර හමුවේ. එහි කි. මී. 1.4ක් පමණ ගමන්කර වමට හැරුණ විට පන්සල පාර හමුවේ. එම පාරේ මීටර් 350ක් පමණ ගියවිට වංගු 3ක් හමුවේ. ඊට පසු අදාළ දේපළ දකුණු පැත්තේ පිහිටා ඇත.

### 2 වැනි උපලේඛනය සඳහන් දේපළ

කෙසෙල්වත්ත හංදියේ සිට (මොරටුව නගරයේ සිට ගාලු පාරේ කි. මී. 3.5ක් පානදුර දෙසට ගමන් කළ විට) දිග්ගල තොටුපල පාර හමුවේ. එම පාරේ කි. මී. 1.7ක් පමණ ගමන්කළ විට අදාළ දේපළ වම් පැත්තේ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.* - විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතු ය.

(01) ගැණුම් මිලෙන් සියයට දහයක් (10%) (02) පළාත් සභා අයබදු සඳහා සියයට එකයි (1%) (03) වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%) (04) නොතාරිස් ගාස්තුව රු. 2,000 (05) ලිපිකරු හා සෝෂක වේතනය රු. 500 (06) වෙන්දේසිය සඳහා වැය කරන ලද සියලුම ප්‍රචාරක වියදම් (07) ගැණුම්කරු විසින් එකතු කළ වටිනාකම් බද්ද (VAT) ගෙවිය යුතුයි. (08) ගැණුම් මිලෙන් ඉතිරි සියයට අනූව (90%) විකිණීමේ දින සිට දින 30ක් තුළ දී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි ප්‍රධාන කාර්යාලයේ හෝ කළුතර ශාඛාවේ තැන්පත් කළ යුතු ය.

හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම සහ වැඩි විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න.

එල්. බී. සේනානායක,
සාම විනිසුරු, බලයලත් ජොෂ්ඨ වෙන්දේසිකරු,
තක්සේරුකරු, උසාවි කොමසාරිස්,
අංක 200, 2 වැනි මහල, උසාවි පාර, කොළඹ 12
දුරකථන/ෆැක්ස් : 011 2445393
ඊමේල් : senaservice@sltnet.lk

ජොෂ්ඨ කළමණාකරු,
කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී.,
අංක 302, ගාලු පාර,
කළුතර.
දුරකථන අංක : 034-2221599/034-2221600-2,
ෆැක්ස් අංකය : 034 - 2221603.

05-784

---

## සම්පත් බැංකුව පී එල් සී
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

### 1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ විකුණුම් නිවේදනය

ජේ. එන්. එල්. ජයතිලක
ගිණුම් අංක 0021 5000 0710

1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ සම්පත් බැංකුව පී එල් සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2005.03.24 වැනි දින යෝජනා කොට සම්මත කරගනු ලැබ 2007.03.02 වැනි දින රජයේ ගැසට් පත්‍රයේ ද 2007.02.21 "දිවයින" "අයිලන්ඩ්" සහ "තිනකුරල්"යන දිනපතා පුවත්පත් වල ද පළකරන ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් තුන් ලක්ෂ හැත්තෑහයදහස් දෙසිය අනූතුනකුත් ශත විසි දෙකක (රු. 376,293.22ක් පමණයි) මුදල ද සහ තවත් රුපියල් තුන් ලක්ෂ විසිදෙදහස් අටසිය හැටක (රු. 322,860ක් පමණයි) මුදල සඳහා වසරකට සියයට විසිහතර (24%) බැගින් 2004 අප්‍රේල් මස 01 වැනිදා සිට වෙන්දේසි දින තෙක් තවදුරටත් පොලී මුදල ද සමග ප්‍රචාරක වියදම් හා වෙනත් අයකිරීම් වෙතොත් ඒවා ද සමග එතෙක් ගෙවා ඇති යම් මුදලක් (වේ නම්) අඩුකොට අයකර ගැනීම සඳහා මෙහි පහත උපලේඛනයේ වඩාත් මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රය මහනුවර බලයලත් වෙන්දේසිකරු අයි. ඩබ්ලිව්. ජයසූරිය විසින් 2015.06.26 වැනි දින පෙ. ව. 10.00 ට පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

උතුරු මැද පළාතේ, අනුරාධපුර පරිපාලන දිස්ත්‍රික්කයේ, නුවරගම් පළාත මධ්‍යම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ග්‍රාම නිලධාරී කොට්ඨාස අංක 293 පණ්ඩුලගම කොරකහවැව පිහිටි මැද ඉඩම නමැති අනුරාධපුර

ඉඩම් කාර්යාලයේ LDO 370/99 හි ලියාපදිංචි කොට ඇති උතුරට : පී. හවඩියාගේ කුඹුර ද, නැගෙනහිරට : ගල්හේනගේ කුඹුරු ද, දකුණට : පී. ජයතිලකගේ උස් ඉඩම ද, හා බටහිරට : හල්මිල්ලකුලම මාර්ග රක්ෂිතය ද, මායිම් වන ප්‍රමාණයෙන් අක්කර දෙකක් (අක්. 2 රූඩ් 0 පර්. 0) වන රජයේ ඉඩම් කොටස එහි ඇති වගාවන් සහ අනෙකුත් සියලුම දේ සමග ම.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමූහ සමාගමේ ලේකම්.

05-786

---

## ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

නුගේගොඩ දිසා අධිකරණයේ දී ය

01. ඉලේපෙරුම ආරච්චිගේ සුනිල් විජේරත්න
අංක 07, චිත්‍රා පටුමග,
ගම්පහ.

02. රමණී සමරසිංහ විජේරත්න,
අංක 07, චිත්‍රා පටුමග,
ගම්පහ.

නඩු අංකය :
MB/024/09 ..............................පැමිණිලිකරුවන්.

*එදිරිව*

සිමාසහිත ෆිනෑන්ස් සහ ගරන්ටි රියල් එස්ටේට් සමාගම,
අංක 97, හයිඩ්පාර්ක් කෝනර්,
කොළඹ 02.

..............................*විත්තිකරු.*

ඉහත අංක සඳහන් නඩුවෙන් මා හට නිකුත් කර ඇති විකිණීමේ අධිකාරි පත්‍රයට අනුව මෙම නඩුවේ විත්තිකරු වන සීමාසහිත ෆිනෑන්ස් සහ ගරන්ටි රියල් එස්ටේට් සමාගම විසින් පැමිණිලිකරුට රු. 72,222,804.17 ක මුදල සහ ඒ මත 2009 ජනවාරි මස 20 වැනි දින සිට එම මුදල සම්පූර්ණයෙන් ම ගෙවා අවසන් කරන තෙක් වර්ෂයකට 26.5% ක් බැගින් වූ පොලිය ද ගෙවිය යුතු බවට නියෝග කොට තීන්දු ප්‍රකාශ කර ඇති හෙයින් එකී ගෙවීමට විත්තිකරු අපොහොසත් වී ඇති හෙයින්, වර්ෂ 2015ක් වූ ජූනි මස 16 වැනි දින පෙ. ව. 10.30 ට ඉහත නම් සඳහන් විත්තිකරුවන්ගේ දේපළ පිහිටි කැස්බෑව ප්‍රාදේශීය සභා සීමාව තුළ කටුවාවල යන ගමේ පිහිටි මහදෙණිය වත්ත නමැති ඉඩමෙන් බෙදා වෙන් කළ කැබලි අංක 4 සහ 5 එම ඉඩමේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

### *උපලේඛනය*

01. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, පල්ලේ පත්තුවේ, සල්පිටි කෝරළේ, කැස්බෑව ප්‍රාදේශීය සභා සීමාව තුළ කටුවාවල ගමේ පිහිටි මහදෙණියවත්ත නැමති ඉඩමේ බෙදා වෙන් කළ ලොට් 4 දරන කොටසට කේ. ඩී. එල්. විජේනායක බලයලත් මිනින්දෝරු තැන විසින් වර්ෂ 2008.04.05 හා 23 යන දිනයන් හි දී මැන සාදන ලද අංක 2693 දරන සැලැස්ම ප්‍රකාර මායිම් උතුරට : ලොට් ආර් 1 සහ 5 ද, නැගෙනහිරට : ලොට් 5 ද, දකුණට : අංක 3176 දරන ප්ලෑනේ ලොට් 4 සහ ලොට් එක්ස් ද, බස්නාහිරට : ලොට් එක්ස් සහ ආර් 1 ද මායිම් තුළ පිහිටි පර්චස් හතයි දශම හතරයි තුන (අ. 0 රූ. 0 පර්. 7.43) ක් හෙවත් හෙක්ටයාර් 0.01879ක් විශාල ඉඩම සහ ඊට අයත් සියලු දේ ද වේ. (මෙම ඉඩම නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් 3099/231 හි ලියාපදිංචි කර ඇත)

02. ඉහත කී කැස්බෑව ප්‍රාදේශීය සභා සීමාව තුළ කටුවාවල ගමේ පිහිටි මහදෙණියවත්ත නමැති ඉඩමේ බෙදා වෙන් කළ ලොට් 5 දරන කොටසට කේ. ඩී. එල්. විජේනායක බලයලත් මිනින්දෝරු තැන විසින් වර්ෂ 2008.04.05 හා 23 යන දිනයන්හි දී මැන සාදන ලද අංක 2693 දරන සැලැස්ම ප්‍රකාර මායිම් උතුරට : ලොට් ආර් 1 සහ 6 දරන කොටස් ද, නැගෙනහිරට : ලොට් 6 ද, දකුණට : අංක 3176 දරන ප්ලෑනේ ලොට් 4 ද, බස්නාහිරට : ලොට් 4 සහ ආර් 1 දරන කොටස් ද යන මායිම් තුළ පිහිටි පර්චස් දහයයි දශම පහයි බිංදුවයි (අ. 0 රූ. 0 පර්. 10.50) ක් හෙවත් හෙක්ටයාර් 0.02656ක් විශාල ඉඩම සහ ඊට අයත් සියලු දේ ද වේ. (මෙම ඉඩම නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් 3099/232 හි ලියාපදිංචි කර ඇත)

*දේපල පිහිටි ස්ථානයට ප්‍රවේශ වන මාර්ගය. -*

කොළඹ - හොරණ ප්‍රධාන බස් මාර්ගයේ බොරලැස්ගමුව නගරය පසුකොට කිලෝමීටර් 01ක් පමණ පිළියන්දල දෙසට ගොස් කටුවාවලදී තිසර ගොඩනැගිලි ද්‍රව්‍ය අලෙවි කරන වෙළඳ සැල අසලින් වමට හැරී මීටර් 150ක් පමණ ඉදිරියට ගිය පසු පාර කෙළවරට මුහුණ ලා මෙම ඉඩම පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.* - වෙන්දේසිය අවසන් වූ වහාම ගැණුම්කරු විසින් විකුණුම් මිලෙන් සියයට විසිපහ (25%) ක මුදලක් ද, අධිකරණයෙන් අනුමත කරන ඇති ගාස්තු චක්‍රය අනුව රජයේ ගාස්තු ද, විකුණුම් මිලෙන් දෙකයි දශම පහක් (2.5%) ක් වූ වෙන්දේසිකරුගේ කොමිස් මුදල ද, පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් සියයට එක (1%) ක මුදලක් ද, වෙන්දේසිය සඳහා වූ සියලුම වියදම් ද, වෙන්දේසිකරු වෙත ගෙවිය යුතු ය.

තවද, ගැණුම්කරු විසින් ඉතිරි සියයට හැත්තෑපහ (75%) ක් වූ මුදල දින 30ක් ඇතුළත එකී නඩුවේ බැරට එකී අධිකරණයේ තැන්පත් කළ යුතු වන අතර, ඒ සඳහා පිළිගත හැකි ඇපකරුවන් දෙදෙනෙකු එම අවස්ථාවේදී ම ඉදිරිපත් කරමින් විකුණුම් කොන්දේසි අත්සන් තැබිය යුතු ය.

*වැඩි විස්තර සඳහා*

01. ඉලේපෙරුම ආරච්චිගේ සුනිල් විජේරත්න
02. රමණී සමරසිංහ විජේරත්න

දෙදෙනාම

අංක 07, චිත්‍රා පටුමග,
ගම්පහ.
දුරකථන අංක 077 7221390

යූ. ඒ. ගාමිණී (එල්. එල්. බී. කොළඹ),
සාම විනිසුරු,
කොළඹ වාණිජ මහාධිකරණයේ බලයලත් වෙන්දේසිකරු,
තක්සේරුකරු සහ උසාවි කොමසාරිස්.

අංක 200/3/ඩී, නෙළුම් පෙදෙස,
කළපළුවාව, රාජගිරිය
දුරකථන අංක 077 - 3648452.

05-785

**නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී**

1990 අංක 04 දරන බැංකු විසින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ පවත්වනු ලබන වෙන්දේසිය

**අධ්‍යක්ෂක මණ්ඩල සම්මුතියේ III කොටසේ සඳහන් දේපළ**

*කොස්ගොඩ, අහුන්ගල්ලේ පිහිටි පර්චස් 31.5 විශාලැති අගනා දේපළක්*

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, වලල්ලාවිට කෝරලේ බෙන්තොට කොස්ගොඩ අහුන්ගල්ලේ පිහිටි ලක්මිණි ගෙදර වත්ත, වෙනදඋපකාරගේවත්ත, සිගෝනා පදිංචිව උන් වීරපනිච්චිගෙදර වත්ත, අඹගහවත්ත හෙවත් දොතගේවත්ත මල්ලව්බෝව්ස්ලාගේ මාවත වත්ත යනුවෙන් හඳුන්වන ඉඩමෙහි බලයලත් මානක ඩී. ජී. මෙන්ඩිස් විසින් සාදන ලද 2003.07.05 දිනැති අංක 6055 දරන පිඹුරෙහි ලොට් 6 ලෙස ලකුණු කර ඇති ප්‍රමාණයෙන් පර්චස් 31.5 ක් බෙදා වෙන්කළ ඉඩම.

ඉහත කී ඉඩම් මත පිහිටි සෑම සියලු ගොඩනැගිලි පරිශ්‍රය, නිශ්චල යන්ත්‍ර, යන්ත්‍රෝපකරණ, සවිකිරීම්, ඇමුණුම්, සේවා සහා විදුලිය සැපයීමේ පද්ධති, ජලය සැපයීමේ උපකරණ, විදුලි සංදේශ උපකරණ වායු සමනය කිරීමේ උපකරණ ඇතුලුවේ.

නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී නමින් මාතර ප්‍රසිද්ධ නොතාරිස් එම්. ඒ. අනුරුද්ධිකා (මහත්මිය) විසින් ලියා සහතික කරන ලද වර්ෂ 2012 සැප්තැම්බර් මස 27 දිනැති අංක 1276 දරන උකස්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම ඩී ඇන්ඩ් ජී ස්පයිසස් එක්ස්පෝර්ට්ස් (ප්‍රයිවට්) සමාගම (ණයට ගන්නා හැටියට) සහ දිනමුනි සවිත්‍රී වික්‍රමරත්න (විවාහයට පෙර මෙන්ඩිස්) සහ දිනේෂා චාමිනි වික්‍රමරත්න (බන්ධනදායින් හැටියට) පැහැර ඇති බැවින් ඉහත කී බැංකුව විසින් මා වෙත පවරන ලද බලය මත ඉහත කී වෙළඳ තොග 2015 ක් වූ ජුනි මස 19 වැනි දින පෙ. ව. 10.30 කණිසමට ඉහත කී දේපළ පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළට පිවිසෙන මාර්ගය.-* අම්බලන්ගොඩ සිට කොළඹ ප්‍රධාන මාර්ගය ඔස්සේ කි. මී. 12ක් පමණ අහුන්ගල්ල කඩ මංඩිය දක්වා ගමන් කොට වමට පිහිටා ඇති ලලිත රාජපක්ෂ මාවතට ඇතුලු වී මීටර් 200ක් පමණ ගමන් කර වමට ඇති කොන්ක්‍රීට් පාරට ඇතුලු වී මීටර් 40ක් පමණ ගමන් කිරීමෙන් පාරේ වම් පසින් පිහිටා ඇති මෙම දේපළට ප්‍රවිශ්ඨ විය හැකි ය.

වෙන්දේසිය අවසානයේ දී සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුදල් එවේලේ ම වෙන්දේසිකරු වෙත ගෙවිය යුතු යි. (1) ගැණුම් මිලෙන් 10% ක මුදලක් ද, (2) පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1% ක්ද සහ වැට් බද්ද (3) වෙන්දේසිකරුගේ ගාස්තු වශයෙන් 2 1/2%ක් ද, (4) සියලුම ප්‍රචාරක හා වෙන්දේසි වියදම් ද, (5) ලිපිකරු සහ සෝෂක ගාස්තු වශයෙන් රු. 3,000 ක් ද ගෙවිය යුතු වන අතර, විකුණුම් මිලේ පරිශේෂය වන 90% ක මුදල වෙන්දේසි දිනයේ සිට දින 30ක් ඇතුළත ඉහත කී බැංකුවේ තැන්පත් කළ යුතු වේ.

හිමිකම් ඔප්පු සහ අනෙකුත් සියලුම ලියකියවිලි හා විස්තර ලබා ගැනීම සඳහා කොළඹ 02, නවම් මාවතේ අංක 40 දරන ස්ථානයේ පිහිටි නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී හි නීති කළමනාකරු මධ්‍යගත ණය ආපසු අයකිරීම්ගෙන් විමසන්න. දුරකථන අංක 2448448, 011 7448448.

අධ්‍යක්ෂ මණ්ඩල සම්මුතියේ සඳහන් වෙළඳ තොග

හික්කඩුව කලුපේ "වික්‍රම විලා" හි පිහිටි ඩී ඇන්ඩ් ජී ස්පයිසස් එක්ස්පෝට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් දරන පරිශ්‍රය තුළ තබා ඇති ගබඩා කර ඇති සෑම ආකාරයකම චංචල දේපළ "වෙළඳ තොග" වෙළඳ භාණ්ඩ, නිමි භාණ්ඩ, සහ වෙනත් සෑම ආකාරයකම චංචල දේපළ යනාදිය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ දකුණු පළාතේ ගාලු දිස්ත්‍රික්කයේ (ගාල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලය ඇතුළත හික්කඩුව, කලුපේ "වික්‍රමවිලා " දරන පරිශ්‍රය තුළ තබා ඇති හෝ ගබඩා කර ඇති කුරුඳු තොග ඇතුලු සෑම සහ සියළු ආකාරයකම වෙළඳ තොග වෙළඳ භාණ්ඩ සහ නිමි භාණ්ඩ සහ වෙනත් සෑම ආකාරයකම චංචල දේපළ සහ ණයට ගන්නන් විසින් කලින් කල ගෙනෙනු ලබන හෝ ඉහත කී පරිශ්‍රය මත ගබඩා කර ඇති හෝ වෙනත් ස්ථානයක තබා ඇති සවිකර ඇති ගබඩා කර ඇති සෑම ආකාරයකම වෙළඳ තොග.

නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී නමින් මාතර ප්‍රසිද්ධ නොතාරිස් එම්. ඒ. අනුරුද්ධිකා (මහත්මිය) විසින් ලියා සහතික කරන ලද වර්ෂ 2011 ජනවාරි මස 05 දිනැති අංක 927 දරන උකස්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම ඩී ඇන්ඩ් ජී ස්පයිසස් එක්ස්පෝර්ට්ස් (ප්‍රයිවට්) සමාගම (ණයට ගන්නා හැටියට) සහ දිනමුනි සවිත්‍රී වික්‍රමරත්න (විවාහයට පෙර මෙන්ඩිස්) සහ දිනේෂා චාමිනි වික්‍රමරත්න (බන්ධනදායින් හැටියට) පැහැර හැර ඇති බැවින් ඉහත කී බැංකුව විසින් මා වෙත පවරන ලද බලය මත ඉහත කී වෙළඳ තොග 2015ක් වූ ජුනි මස 19 වැනි දින පෙ. ව. 11.30 කණිසමට ඉහත කී චංචල දේපළ තබා ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*ගෙවීමේ ක්‍රමය. -* වෙන්දේසිය අවසානයේ දී පහත සඳහන් මුදල් එවෙලේ ම වෙන්දේසිකරු වෙත ගෙවා සිටිය යුතු ය. (1) සම්පූර්ණ ගැණුම් මුදල (2) වෙන්දේසිකරුගේ ගාස්තුව 2 1/2%ක් (3) වෙන්දේසිය සඳහා දරන්නට සිදු වූ සියලුම වියදම් (4) සෝෂක හා ලිපිකරු ගාස්තු රු. 3,000 (5) විකිණීමේ කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තුව රු. 7,500 ක් ද වේ.

අධ්‍යක්ෂ මණ්ඩල සම්මුතියේ i කොටස් සඳහන් දේපළ හික්කඩුව, කලුපේ පිහිටා ඇති රූඩ් 2, පර්චස් 20, රූඩ් 2, පර්චස් 20, රූඩ් 1, පර්චස් 20, සහ පර්චස් 3.5 විශාලැති ගොඩනැගිලි සහිත අගනා ඉඩම් කැබලි.

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, වැල්ලබඩ පත්තුවේ කලුපේ පිහිටි "හුන්නන්ගේ පිට්ටණිය වත්ත" යනුවෙන් හඳුන්වනු ලබන ඉඩමෙහි බලයලත් මානක ඩබ්ලිව්. ජී. ඩී. යූ. කරුණාරත්න විසින් සාදන ලද 2010.03.31 වැනි දිනැති අංක 57 ඒ දරන පිඹුරේ සඳහන් ඒ 2, ඒ 1, ඒ 3 සහ ඒ 4 ලෙස ලකුණු කර ඇති බෙදා වෙන් කළ ඉඩම් කොටස් සහ ඉහත කී ඉඩම් මත පිහිටි සෑම සියලු ගොඩනැගිලි පරිශ්‍රය, නිශ්චල යන්ත්‍ර, යන්ත්‍රෝපකරණ, සවිකිරීම්, ඇමුණුම්, සේවා සහ විදුලිය සැපයීමේ පද්ධති, ජලය සැපයීමේ උපකරණ, විදුලි සංදේශ උපකරණ වායු සමනය කිරීමේ උපකරණ ඇතුලු වේ.

නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී නමින් මාතර ප්‍රසිද්ධ නොතාරිස් එම්. ඒ. අනුරුද්ධිකා (මහත්මිය) විසින් ලියා සහතික කරන ලද වර්ෂ 2010 ජුනි මස 17 දිනැති අංක 827 හා 2011 ජනවාරි මස 05 වැනි දිනැති අංක 925 දරන උකස්කරයන් යටතේ අයවිය යුතු මුදල් ගෙවීම ඩී ඇන්ඩ් ජී ස්පයිසස් එක්ස්පෝර්ට්ස් (ප්‍රයිවට්) සමාගම (ණයට ගන්නා හැටියට) සහ දිනමුනි සවිත්‍රි වික්‍රමරත්න (විවාහයට පෙර මෙන්ඩිස්) සහ දිනේෂා චාමිනී වික්‍රමරත්න (බන්ධනදායින් හැටියට) පැහැර ඇති බැවින් ඉහත කී බැංකුව විසින් මා වෙත පවරන ලද බලය මත ඉහත කී වෙළඳ තොග 2015 ක් වූ ජුනි මස 19 වැනි දින පිළිවෙලින් පෙ. ව. 11.45 කණිසමට ඉහත කී දේපළ පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළට ප්‍රවිශ්ඨ වන මාර්ගය* .- හික්කඩුව බස් නැවතුම් පොළේ සිට කොළඹ මහ මාර්ගය ඔස්සේ කි. මී. 1 1/2 පමණ වැල්ලවත්ත පාලම දක්වා ගොස් පාලම පසුකර මීටර් 200ක් පමණ ඉදිරියට ගොස් දකුණට පිහිටා ඇති තොටගමුව පාරට හැරී කි. මී. 1 කණුව දක්වා ගමන් කිරීමෙන් කැබලි අංක ඒ 1, ඒ 2, ඒ 3 කැබලි මෙම පාරේ වම් පසින් ද ඒ 4 කැබැල්ල මෙම පාරේ දකුණු පසින් ද පිහිටා ඇත.

සම්මුතියේ ii කොටසේ සඳහන් දේපළ පර්චස් 22.75ක් විශාලැති ගාලු කඩවත් සතර තුළ ගාලුපියැද්දේ පිහිටි අගනා දේපළක්.

දකුණු පළාතේ, ගාලු දිස්ත්‍රික්කයේ, ගාලු කඩවත් සතර තුළ ගාලුපියැද්දේ පෙට්ටිගල ඇළ අද්දර බණ්ඩාරවත්ත ලෙස හඳුන්වනු ලබන ඉඩමෙහි ලොට් 4 සහ පෙට්ටිගලගොඩ බණ්ඩාරවත්ත ලෙස හඳුන්වනු ඉඩමෙහි ලොට් 2, 3 සහ 5 දරන ඒකාබද්ධ ඉඩම් සහිත ලොට් ඒ යනුවෙන් හඳුන්වනු ලබන ඉඩමෙහි (ගාලු දිසා අධිකරණ බෙදුම් නඩු අංක 34765 හි නඩු වාර්තාවේ ගොනු වී ඇති බලයලත් මානක වී. එල්. ඩී. අබේගුණවර්ධන විසින් සාදන ලද 1938.06.07 දිනැති අංක 3069 දරන පිඹුරෙහි ලොට් 1 දරන ප්‍රමාණයෙන් පර්චස් 27.75 විශාලැති ඉඩම.

ඉහත කී ඉඩම් මත පිහිටි සෑම සියලු ගොඩනැගිලි පරිශ්‍රය, නිශ්චල යන්ත්‍ර, යන්ත්‍රෝකරණ, සවිකිරීම්, ඇමුණුම්, සේවා සහ විදුලිය සැපයීමේ පද්ධති, ජලය සැපයීමේ උපකරණ, විදුලි සංදේශ උපකරණ වායු සමනය කිරීමේ උපකරණ ඇතුලු වේ.

නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී නමින් මාතර ප්‍රසිද්ධ නොතාරිස් එම්. ඒ. අනුරුද්ධිකා (මහත්මිය) විසින් ලියා සහතික කරන ලද වර්ෂ 2011 ජනවාරි මස 21 දිනැති අංක 937 හා 2012 සැප්තැම්බර් මස 27 වැනි දිනැති අංක 1278 දරන උකස්කරයන් යටතේ අයවිය යුතු මුදල් ගෙවීම ඩී ඇන්ඩ් ජී ස්පයිසස් එක්ස්පෝරට්ස් (ප්‍රයිවට්) සමාගම (ණයට ගන්නා හැටියට) සහ දිනමුනි සවිත්‍රී වික්‍රමරත්න (විවාහයට පෙර මෙන්ඩිස්) සහ දිනේෂා චාමිනි වික්‍රමරත්න (බන්ධනදායින් හැටියට) පැහැර ඇති බැවින් ඉහත කී බැංකුව විසින් මා වෙත පවරන ලද බලය මත ඉහත කී දේපළ 2015ක් වූ ජුනි මස 19 වැනි දින ප. ව. 2.30 කණිසමට ඉහත කී දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළට ප්‍රවිශ්ඨ වන මාර්ගය*.- ගාල්ල බස් නැවතුම් පළ අසල සිට කෙලින් වීදියේ ඔස්සේ මීටර් 500ක් පමණ කෙලින් වීදිය අවසාන තෙක් ගමන් කර මාතර පාරට ප්‍රවිශ්ඨ වී (ඉදිරියට) ඉන්ධන පිරවුම් හළ දක්වා මීටර් 300ක් පමණ ගමන් කර ඉන්ධන පිරවුම් හළ අසළින් ම වමට හැරී අඩි 12ක් පළලැති පාරේ මීටර් 40ක් පමණ ගමන් කිරීමෙන් මෙම දේපළ හමුවේ. මෙම පාර අවසන් වන්නේ මෙම දේපළෙනි.

වැඩිදුර විස්තර සඳහා 2015.05.08 වැනි දින ශ්‍රී ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයද, 2015.04.27 වැනි දින "ද අයිලන්ඩ්" "දිවයින සහ තිනකුරල් පුවත් පත් බලන්න.

වෙන්දේසිය අවසානයේ දී සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුදල් එවේලේ ම වෙන්දේසිකරු වෙත ගෙවිය යුතුයි. (1) ගැණුම් මිලෙන් 10% ක මුදලක් ද, (2) පලාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1%ක් ද, සහ වැට් බද්ද (3) වෙන්දේසිකරුගේ ගාස්තු වශයෙන් 2 1/2% ක් ද, (4) සියලුම ප්‍රචාරක හා වෙන්දේසි වියදම් ද, (5) ලිපිකරු සහ සෝෂක ගාස්තු වශයෙන් රු. 3,000 ක් ද, ගෙවිය යුතු වන අතර විකුණුම් මිලේ පරිශේෂය වන 90% ක මුදල වෙන්දේසි දිනයේ සිට දින 30ක් ඇතුළත ඉහත කී බැංකුවේ තැන්පත් කළ යුතු වේ.

හිමිකම් ඔප්පු සහ අනෙකුත් සියලුම ලියකියවිලි හා විස්තර ලබා ගැනීම සඳහා කොළඹ 02 නවම් මාවතේ අංක 40 දරන ස්ථානයේ පිහිටි නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී හි නීති කළමනාකරු මධ්‍යගත ණය ආපසු අයකිරීම් ගෙන් විමසන්න. දුරකථන අංක 2448448, 011 7448448.

පී. කේ. ඊ. සේනාපති,
උසාවි කොමසාරිස් තක්සේරුකරු හා
වරලත් වෙන්දේසිකරු.

අංක 134, බැද්දගාන පාර,
කෝට්ටේ
දුරකථන අංක : 2873656, 0777 - 672082 ෆැක්ස් අංකය : 2871184.

05-789

---

## ප්‍රසිද්ධ ඉඩම් වෙන්දේසියක්

මීගමුව දිසා අධිකරණයේ දී ය.

බස්නාහිර පළාත් සභාවේ 1998 අංක 3 දරන සමුපකාර සමිති ප්‍රඥප්තියේ අංක 59 (1) "ආ" සහ 59 (3) වගන්තිය යටතේ සහ 1983 අංක 32 සහ 1992 අංක 11 දරන පනත් වලින් සංශෝධිත 1972 අංක 5 දරන සමුපකාර සමිති පනතේ 59 (1) (ආ) සහ 59 (3) වගන්තිය යටතේ කරනු ලබන ඉල්ලීමයි.

ගම්පහ සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස්
වලව්වත්ත, කිඩගම්මුල්ල, ගම්පහ.

..............................*පෙත්සම්කරු,*

*එදිරිව*

නඩු අංකය : 3351
විශේෂ

01. ඩබ්ලිව්. ඒ. එස්. නදුන් ලහිරු ප්‍රීමාල් ජැන්ස් අංක 144/1, හල්පේ, කටාන.

02. ඩබ්ලිව්. ඒ. ඩී. පද්මකාන්ති අංක 144/1, කොච්චිකඩේ පාර, හල්පේ, කටාන

03. ඩබ්ලිව්. එම්. අනිල් ලින්කන් කොච්චිකඩේ පාර, පහල මඩම්පැල්ල, අකරගම.

04. ඒ. කේ. ඒ. හරිස්චන්ද්‍ර අභයසිංහ මූකලන්ගෙදර, මැල්ලවගෙදර.

.................................*වග උත්තරකරුවෝ.*

මීගමුව දිසා අධිකරණයේ ඉහත අංක දරන නඩුවෙන් මා වෙත නිකුත් කර ඇති දේපල විකිණීමේ නියෝගය මත ඉහත 1 වැනි සහ 2 වැනි වගඋත්තරකරුවන්ගෙන් පෙත්සම්කරුට අයකර ගැනීමට ඇති රු. 5,66,182

මුදල සහ රු. 481,505 ක මුදල මත 2012.10.08 වැනි දින සිට නඩු පවරන ලද දින තෙක් 15% ක වාර්ෂික පොලියක් ද, නඩුව පැවරූ දින සිට සම්පූර්ණ මුදල ගෙවා අවසන් වන තෙක් නෛතික පොලිය ද අයකර ගැනීම සඳහා මෙහි පහත උපලේඛනයේ විස්තර වන දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන ලෙසට මා වෙත නියෝග කර ඇති බැවින් එම මුදල් අයකර ගැනීම සඳහා හල්පේ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් විස්සක් (අ. 0 රූ. 0 පර්. 20) විශාල ඉඩම සහ එහි පිහිටි නිවස ඇතුලු සියලු දේ. 2015 ජූනි මස 23 වැනි දින පෙ. ව. 11.30 ට එකී දේපළ පිහිටි ස්ථානයේ ම විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් ප්‍රසිද්ධියට පත් කරනු ලැබේ.

*ගෙවීමේ ක්‍රමය.* - වෙන්දේසියේ දී, දේපළ ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් මුදල් වෙන්දේසිකරු වන මා වෙත ගෙවිය යුතු ය. සියලුම ගෙවීම් මුදලින් පමණක් කළ යුතු අතර චෙක්පත් භාරගනු නොලැබේ.

1. වෙන්දේසියේදී මුළු ගැණුම් මුදලෙන් සියයට විසිපහක (25%) මුදලක්, ඉතිරි සියයට හැත්තෑපහක (75%) ක මුදල වෙන්දේසි දින සිට දින තිහක් (30)ක් ඇතුළත මීගමුව දිසා අධිකරණයේ ඉහත අංක දරන නඩුවට තැන්පත් කළ යුතු ය.

2. වෙන්දේසිය පැවැත්වීම සඳහා *රජයේ ගැසට් පත්‍රයේ* සහ දිනපතා පුවත්පතක වෙන්දේසි දැන්වීම් ප්‍රසිද්ධ කිරීමේ ගාස්තු ඇතුලු වෙන්දේසිය පැවැත්වීම සඳහා වන සියලුම වියදම්,

3. අදාළ පලාත් පාලන ආයතනයට ගෙවිය යුතු මුළු මුදලින් සියයට එක (1%) වෙළඳ බද්ද

4. විකිණීමේ කොන්දේසි සහතික කිරීමේ නීතිඥ ගාස්තු,

5. වෙන්දේසිකරුගේ කොමිස් මුදල මුළු මුදලින් සියයට දෙකහමාරක් (2 1/2%),

6. පොලිස් නිලධාරීන්ට බටා මුදල්, ලිපිකරු හා සෝෂක ගාස්තු.

*දේපළට පිවිසෙන මාර්ගය.* - මීගමුව හලාවත මාර්ගයේ කොච්චිකඩේ හංදියෙන් මඩම්පැල්ල මාර්ගයේ හල්පේ කි. මී. 8 කණුව ආසන්නයේ එම මාර්ගයට මුහුණලා දකුණු පැත්තට මෙම දේපළ පිහිටා තිබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයට අයත් අළුත්කුරු කෝරළේ දූනගහ පත්තුවේ හල්පේ තිබෙන කොන්ගහවත්ත නමැති ඉඩමෙන් බෙදා වෙන්කරන ලද ලොට් අංක ජී 1 දරන බිම් කොටසට 1993.02.06 වැනි දින වෝල්ටර් ඒ ප්‍රනාන්දු මානක තැන විසින් මැන සෑදූ අංක 5572 ඒ දරන සැලැස්ම මත එකී මානක තැන විසින් 2001.05.18 වැනි දින එකී මානක තැන විසින් කරන ලද උප බෙදුම අනුව මායිම්, උතුරට : කොච්චිකඩේ සිට මඩම්පැල්ලට විහිද යන මහා මාර්ග ද, නැගෙනහිරට : ලොට් බී දරන කොටස ද, දකුණට : ලොට් ඒ 2 දරන කොටස ද, බස්නාහිරට : මෙම ඉඩමේ කොටසක් ද මායිම් වූ පර්චස් දහයක් (අ. 0 රූ. 0 පර්. 10) විශාල ඉඩම් කොටස සහ ඒ තුළ පිහිටි සෑම සියලු දේත්, එකී හල්පේ පිහිටි කොන්ගහවත්ත නමැති ඉඩමෙන් බෙදා වෙන්කරන ලද ලොට් ඒ 2 දරන බිම් කොටසට එකී අංක 5572 ඒ දරන සැලැස්ම ප්‍රකාර මායිම්, උතුරට : ලොට් ඒ 1 දරන කොටස ද, නැගෙනහිරට : ලොට් බී දරන කොටස ද දකුණට : ජෝශප් ඇලෝසියස් හලහාකෝන්ගේ ඉඩමද, බස්නාහිරට : මෙම ඉඩමේ කොටසක් ද මායිම් වූ පර්චස් දහය (අ. 0 රූ. 0 පර්. 10) විශාල ඉඩම් කොටස සහ ඒ තුළ පිහිටි සෑම සියලු දේත් වේ. (පෙර ලියාපදිංචිය ඊ 857/32,33)

එන්. ජේ. එදිරිසිංහ,
මීගමුව දිසා අධිකරණයේ
උසාවි කොමසාරිස්, වෙන්දේසිකරු සහ
තක්සේරුකරු.

2015 මැයි මස 14 වැනි දින,
අංක 244, පරණ කොට්ටාව පාර,
ඇඹුල්දෙණිය, නුගේගොඩ.
දුරකථන අංකය : 0777 - 453463.

05-762

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.